# අ.පො.ස (උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව



# මූලික ආර්ථික ගැටලු විසඳීම

## මූලික ආර්ථික ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි.



නිපුණතාවය 1.6 : මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි.

## 1.6.1 ආර්ථික පද්ධති

- මූලික ආර්ථික ප්‍රශ්ණ විසදීමෙහිලා මිනිසුන් විසින් නිර්මාණය කරන ලද යාන්ත්‍රණය හෙවත් වැඩපිළිවෙල ආර්ථික පද්ධතියක් ලෙස හඳුන්වයි.
- ආර්ථිකයක් තුල ඉටුවන ප්‍රධාන කාර්ය වන්නේ මූලික ආර්ථික ප්‍රශ්ණ තුන විසදීමයි.
  - ✓ කුමක් කොපමණ නිපදවනවාද
  - ✓ කෙසේ නිපදවනවාද
  - ✓ කා සඳහා නිපදවනවාද

## 1.6.2 ආර්ථික පද්ධතියක මූලිකාංග

- සම්පත් හිමිකාරිත්වය
- මූලික ආර්ථික ප්‍රශ්ණ විසදීමෙහිලා තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය
- සානුබල පද්ධතිය

- සම්පත් හිමිකාරිත්වය
  - ආර්ථික පද්ධතියක් නිර්මාණය කිරීමෙහිලා සම්පත් සම්භාරයක් පැවතිය යුතු අතර සම්පත් වල හිමිකරුවන් (පෞද්ගලික අංශය රාජ්‍ය අංශය) සිටිය යුතුය. එකී සම්පත් හිමිකරුවන් එම සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවිය යුතුය.
  - දේපළ සම්පත්වල ප්‍රධාන ස්වරූප තුනකි.
    - ✓ මූර්ථ දේපළ - ඉඩම් , ගොඩනැගිලි , වාහන
    - ✓ මූල්‍යමය දේපළ - ව්‍යාපාර කොටස් , ණයකර , බැඳුම්කර
    - ✓ බුද්ධිමය දේපළ - පරිගණක වැඩසටහන් , නිර්මාණ , ගීත
  - දේපළ සම්පත් හිමිකාරිත්වයේ ප්‍රධාන ස්වරූප තුනකි.
    - ✓ දේපළ රිසි පරිදි භාවිතා කිරීමේ අයිතිය (Control Rights)
    - ✓ ආදායම් ලැබීමේ අයිතිය (Cash Flow Rights)
    - ✓ විකිණීමට හෝ හුවමාරු කිරීමේ අයිතිය (Disposal Rights)


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.6 : මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි.**

- මූලික ආර්ථික ප්‍රශ්ණ විසඳීමෙහිලා තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය
  - මිල යාන්ත්‍රණය
  - මධ්‍යගත සැළසුම් යාන්ත්‍රණය

- සානුබල පද්ධතිය
  - ආර්ථික පද්ධතියක් තුල තීරණ ගන්නා ආයතනික ඒකක දිරිගැන්වීමේ ක්‍රමෝපාය සානුබල පද්ධතියක් වේ.
  - සානුබල ස්වරූප තුනකි.
    - ✓ ද්‍රව්‍යමය ප්‍රතිලාභ සහිත සානුබල
    - ✓ බලය පදනම් කරගත් සානුබල
    - ✓ යුක්තිය හා සදාචාරය සහිත සානුබල

  - ආර්ථික පද්ධතියක් තුල තීරණ ගන්නා පාර්ශවයන්
    - ✓ කුටුම්භ
    - ✓ ව්‍යාපාර ආයතන
    - ✓ රජය
    - ✓ කම්කරු සංවිධාන
    - ✓ රාජ්‍ය නොවන සංවිධාන
    - ✓ සිරිත් සම්ප්‍රදායන්
    - ✓ සංස්කෘතිය , නෛතික ව්‍යුහය

  - කුටුම්භවල කාර්යයන්
    - ✓ නිෂ්පාදන සාධක සැපයීම
    - ✓ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම
    - ✓ බදු ගෙවීම
    - ✓ ඉතිරි කිරීම
    - ✓ සංක්‍රාම ලැබීම / ගෙවීම

  - ව්‍යාපාර ආයතනවල කාර්යයන්
    - ✓ නිෂ්පාදන සාධක මිලදී ගැනීම
    - ✓ භාණ්ඩ හා සේවා නිපදවීම
    - ✓ බදු ගෙවීම



The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.6 : මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංවිධානය වන ආකාරය විශ්ලේෂණය කරයි.**

- ✓ ආයෝජනය කිරීම
- ✓ සහනාධාර ලැබීම

- ➢ රාජ්‍ය අංශය ගන්නා තීරණ
  - ✓ සම්පත් බෙදා වෙන් කිරීම
  - ✓ ආර්ථික ස්ථායීතාව ඇති කිරිම
  - ✓ ආර්ථික වෘද්ධිය ඇති කිරිම
  - ✓ ආදායම් පුනර්ව්‍යාප්ත කිරීම (බදු පැනවීම හා සහනාධාර දීම)

## ක්‍රියාකාරකම්

පහත රූප සටහන් වලින් දැක්වෙන ආයතනයන්ගේ කාර්යයන් දක්වන්න

| ආයතනය | කාර්යයන් |
|---|---|
|  | |
|  | |
|  | |



Copyright © e-thaksalawa.moe.gov.lk